ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு சக்தி அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority
A Statutory Authority of Ministry of Power & Renewable Energy

අපගේ යොමුව: RE/05/05

6 දෙසැම්බර් 2016

සියළු දෙනාගේ දැනගැනීම පිණිසයි

**<u>ස්පෙක්ට්‍රා ජීව ඉන්ධන ජලතාපකය (Biomass fired water heater)</u>**

කුරුණෑගල මහකෙලියේ ඇති ස්පෙක්ට්‍රා ඉන්ඩස්ට්‍රීස් ලංකා (පුද්ගලික) සමාගම විසින් නිපදවා අලවිකරන, ජීව ඉන්ධන ජල තාපකයේ (Biomass fired water heater) ක්‍රියාකාරිත්වය අප ආයතනයෙන් පරීක්ෂාකර ඇති අතර, එමගින් පෙට්‍රල්/ඩීසල්/භූමි තෙල් හෝ එල්. පී. වායුව භාවිතයට වඩා ලාභදායී සහ පරිසර හිතකාමී ලෙස උණු ජලය ලභාගත හැකිබව තහවුරුවී ඇත.

ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති, පැරිස් පාරිසරික ගිවිසුම අනුව, වසර 2030 වනවිට හරිතාගාර වායු විමෝචන 20%ක් දක්වා අඩුකර ගැනීමට එකඟවී ඇති අතර එම අරමුණු සාක්ෂාත්කරගැනීම සඳහා පොසිල ඉන්ධන භාවිතය වෙනුවට මෙවැනි ජෛව ඉන්ධන භාවිතාකරන උපකරණ ප්‍රවර්ධනය කලයුතුව ඇත.

දැනට මෙම උපකරණය, රෝහල්, ළමා නිවාස, ආපන ශාලා, ලැගුම් හල් ආදී ස්ථාන රැසක භාවිතාවන අතර, බොහෝ ස්ථානවල මුළුතැන්ගෙයින් ඉවත්කරන පොල් කටු, ගෙවත්තෙන් ලබාගන්නා දර භාවිතාකිරීම හේතුවෙන්, ඉන්ධන සඳහා අමතර වියදමක් වැයනොවේ.තවද පරිසරය පවිත්‍රව තබාගැනීමටද මෙය පිටිවහලක්වේ.

මෙවැනි පරිසර හිතකාමී, පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ක්‍රියාකරන උපකරණයක් නිෂ්පාදනයකර වෙළඳපොලට හඳුන්වාදීමටකටයුතු කල ස්පෙක්ට්‍රා ඉන්ඩස්ට්‍රීස් ආයතනයඇගයීමට ලක්කරන අතරමෙම නිෂ්පාදනය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය අනුග්‍රහය ලබාදීමට සුදුසුබව නිර්දේශ කරමු.

මෙයට විශ්වාසී

.............................................
එම්. එම්. ආර් පත්මසිරි
අධ්‍යක්ෂ ජෙනරාල්

අංක 05 ගොඩනැගිල්ල, පළමු මහල, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
5ம் கட்டடம், முதலாம் மாடி, BMICH, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07, இலங்கை.